ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගෞරව
උපාධි වැඩසටහන - 2023/2024
පස්වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
STU5415 - අධ්‍යාපන කළමනාකරණය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2024.12.18 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. අධ්‍යාපනයේ "අභ්‍යන්තර කාර්යක්ෂමතාවය" සහ "බාහිර කාර්යක්ෂමතාවය" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද ? කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරිපාලන ව්‍යුහය අඳ දක්වන්න.

03. කලාප අධ්‍යාපන කාර්යාල සංවිධානයක ප්‍රධාන කාර්යයන් පහක් (05) සඳහන් කරන්න.

04. "යම් සංවිධානයක් සාර්ථකත්වය කරා ගෙන යාමට එහි ප්‍රධානියා සතු නායකත්ව ලක්ෂණ සහ කළමනාකරණ කුසලතා ඉතා වැදගත් වේ."

    ඉහත වගන්තිය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. "සාර්ථක කළමනාකරණ ක්‍රියාවලියකදී අධීක්ෂණය යනු එක් වැදගත් පියවරකි."

    අධීක්ෂණය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

06. නාට්‍ය හා රංගකලා හෝ විද්‍යා/ ගණිත ගුරුවරයෙකු ලෙස කළමනාකරණය පිළිබඳ දැනුම වැදගත් වන්නේ ඇයි?

07. සම්භවන ඇගයීම සහ සම්පිණ්ඩිත ඇගයීම කළමනාකරණ ක්‍රියාවලියකදී වැදගත් වන්නේ කෙසේද?

08. අධ්‍යාපන කළමනාකරුවන්ට නායකත්වය සහ කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබාදීමෙන් අත්කරගත හැකි ප්‍රතිලාභ පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 5x8=40)

## දෙවන කොටස

09. (i.) "නායකත්වය" යන්න පිළිගත් නිර්වචනයක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii.) පාසලේ නායකයා ලෙස විදුහල්පතිගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) ආයතන ප්‍රධානියෙකු සතු පස්විධ බලයන් උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i.) F.W. ටේලර් විසින් ඉදිරිපත් කරන ලද විද්‍යාත්මක කළමනාකරණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) පාසල් කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීම සඳහා විද්‍යාත්මක කළමනාකරණ ක්‍රියාවලිය දායක කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) විද්‍යාත්මක කළමනාකරණය, පාසල් කළමනාකරණ ක්‍රියාවලියට දායක කර ගැනීමේදී ඇතිවිය හැකි ගැටලු දෙකක් **(02)** දක්වා ඒවා මඟ හරවා ගැනීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

11. (i.) ඵලදායි පාසලක දැකිය හැකි විශේෂ ලක්ෂණ හයක් **(06)** සඳහන් කරන්න. (ලකුණු 06)

(ii.) ඵලදායී පාසලක අන්තර් පුද්ගල සබඳතා කෙරෙහි ගුරුවරුන්ගේ භූමිකාව බලපාන්නේ කෙසේද යන්න උදාහරණ දෙකක් **(02)** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) "ඵලදායී පාසලක කාර්යක්ෂමතාව ඉහළ මට්ටමක පවතී"

පාසලක කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේදී මතුවිය හැකි ගැටලු දෙකක් (02) සඳහන් කර, එම ගැටලු මගහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

12. (i.) 1987 ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලියට සිදුවූ බලපෑම කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii.) අධ්‍යාපන පද්ධතිය තුල විමධ්‍යගතකරණය හේතුවෙන් පැනනැගිය හැකි ගැටලු දෙකක් **(02)** දක්වා එම ගැටලු මඟහරවා ගැනීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(iii.) ශ්‍රී ලංකාවේ පාසල් කළමනාකරණය සඳහා විමධ්‍යගතකරණයේ වැදගත්කම කරුණු දෙකක් **(02)** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. "අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් සඳහා පාසල් මට්ටමේ අධීක්ෂණය ඉමහත් කාර්යභාරයක් ඉටුකරයි."

(i.) පාසල් මට්ටමේ අධීක්ෂණයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) ඔබගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අධීක්ෂණය කරන නිලධාරියෙකු සතුව තිබිය යුතු ගුණාංග **හයක් (06)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 06)

(iii.) පන්ති අධීක්ෂණ ක්‍රියාවලිය හේතුවෙන් නාට්‍ය හා රංගකලා/ විද්‍යා හා ගණිත ගුරුවරයෙකු ලෙස ඔබට ලැබෙන ප්‍රතිලාභ **දෙකක් (02)** උදාහරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

-හිමිකම් ඇවිරිණි.-